3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) ශ්‍රී ලංකා ජාත්‍යන්තර නේවර් ලවින් පාසල සඳහා අවශ්‍ය ආධාර සහ මූල්‍යමය ආධාර සැපයීම, නඩත්තු කිරීම සහ අධ්‍යාපන කටයුතු නොමිලේ පවත්වාගෙන යාම සහ සර්ව ආගමික සේවාවන්;

(ආ) දිළිඳු සහ අසරණ අය සඳහා නිවාස, සෞඛ්‍ය පහසුකම්, පිරිසිදු පානීය ජල අවශ්‍යතාවන් සපුරාලීම;

(ඇ) පරිසර හිතකාමී සේවාවන් සහ ජාතික වටිනාකමක් ඇති සියලු දේපළ ආරක්ෂා කිරීම, සහ වැඩිදියුණු කිරීමට කටයුතු කිරීම;

(ඈ) අධ්‍යාපනය ලබන දුප්පත් දරුවන්ගේ අධ්‍යාපනය නගා සිටුවීම සඳහා අවශ්‍ය උපකරණ හා පහසුකම් සැපයීම;

(ඉ) අඩු ආදායම්ලාභී දරු දැරියන්, තරුණ තරුණියන් සහ වැඩිමහල් අයගේ පෝෂණ තත්ත්වයන් නගාසිටුවීම සහ ක්‍රීඩා දක්ෂතාවන් වැඩි දියුණු කර ජාතික මට්ටමට ගෙන යාමට කටයුතු කිරීම;

(ඊ) හෙළ කලා ශිල්ප ප්‍රගුණ කරන්නන් සඳහා කලා ශිල්ප පීඨයක් ලෙස කලායතනය උසස් ප්‍රමිතියෙන් යුක්තව පවත්වාගෙන යාම සහ විදේශීය සම්බන්ධීකරණයෙන් ශිෂ්‍යත්ව, සංචාර සැලසුම් කිරීම;

(උ) දූයේ දරු දැරියන්ට සම්ප්‍රදායික නර්තනය, සංගීතය හා බෙර වාදන ශිල්පයන් සහ එම රංග භාණ්ඩ නිපදවීම හා අලුත්වැඩියා කිරීම නොමිලයේ ප්‍රගුණ කිරීමේ අවස්ථාව උදාකරමින් පාඨමාලාවන් සැකසීම;

(ඌ) විශේෂයෙන් අසරණ ළමයින් සඳහා ළමා නිවාස ඇති කිරීම, වැඩිහිටියන් සඳහා වැඩිහිටි නිවාස ඇති කිරීම සහ පවතින එම ආයතනවල පහසුකම් වැඩි දියුණු කිරීම සහ ස්වාභාවික ආපදාවන්වල දී හා හදිසි විපත්වල දී සහන සැපයීම හා සුබසාධනය වැඩි දියුණු කිරීම;

